සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අප්‍රේල් මාසය - 3 සතිය පුනරීක්ෂණ 3

1)මෙම ආප්තෝපදේශ නිවැරදි කර නැවත ලියන්න

1.අවි ගත්තෝ කඩුවෙන් ම නසිති.

2.අඟුරු , වතුරෙන් සේදුවත් සුදු නොවේ.

3.පිරුණු කළේ දිය සැලේ. ( 3×5 )

2) කවිය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

ගසක දොඩම් මදෙයි කියා කෑදැයි අපෙ අම්මා

අහස තරුත් මදෙයි සිතා විලි ලූදැයි අම්මා

.................................................... .......

සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා

1.කවියෙහි හිස්තැන සම්පූර්ණ කරන්න

2.කවියෙහි තේරුම ලියන්න

3.කවියෙහි ඇති ප්‍රාර්ථනය කුමක් ද? ( 3×5 )

3)මෙම වචන සඳහා සමානාර්ථ පද 2 බැගින් ලියන්න.

* පොල් * මැණික් * රන් * සඳ * රජ ( 3×5 )

4)' නො' නිපාතය යොදා මෙම වචන නැවත ලියන්න

1. නිසි 2.ගැළපෙන 3.දුටු 4.හැකි 5.බලා ( 2×5 )

5)මෙම යුගල පද යොදා වාක්‍ය 5ක් තනන්න.

1.කාබී 2. ඉහළපහළ 3.අබලදුබල 4.කයිකතන්දර 5.ලටපට ( 2×5 )

6) කෙටි පිළිතුරු සපයන්න

1.මහප්‍රාණ අක්ෂර කීය ද? ඒවා නම් කරන්න

2.න භජෙ පාපකෙ මිතෙත ..... යන ගාථාවෙහි තේරුම ලියන්න

3.මූර්ධජ අක්ෂර යෙදුණු වාක්‍ය 5ක් ලියන්න. ( 5×3 )

7) ජල සම්පත සුරකිමු . මැයෙන් රචනයක් ලියන්න (20)